# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2051/35 - 2017 දෙසැම්බර් මස 29 වැනි සිකුරාදා - 2017.12.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### ඌව පළාතේ පළාත් සභාව

ඌව පළාතේ පළාත් සභාවේ 2017 අංක 5 දරන ඌව නවෝදය අරමුදල්
ප්‍රඥප්තිය අනුමත කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඌව පළාතේ, පළාත් සභාව විසින් 2017.11.09 වැනි දින සම්මත කරන ලදුව 2017.12.11 වන දින ඌව පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කර ඇති පූර්වෝක්ත ප්‍රඥප්තිය සියලු දෙනාගේ දැනගැනීම පිණිස මෙහි පළ කරමි.

ආර්. ඒ. එච්. ඒ. සමරසිංහ,
ලේකම්,
ඌව පළාතේ, පළාත් සභාව.

2017 දෙසැම්බර් මස 20 වැනි දින
බදුල්ල රජ වීදියේ පිහිටි
ඌව පළාත් සභා ලේකම් කාර්යාලයේ දී ය.

**ඌව පළාතේ පළාත් සභාව**

**2017 අංක 5 දරන ඌව නවෝදය අරමුදල් ප්‍රඥප්තිය**

ඌව පළාත තුළ විශ්ව විද්‍යාල ප්‍රවේශයට සුදුසුකම් ලැබූ සහ උසස් පෙළ හැදෑරීමට සුදුසුකම් ලැබූ දක්ෂතා දැක්වූ දරුවන්ගේ අධ්‍යාපන අවශ්‍යතා සඳහා මූල්‍යාධාර සැපයීම හා ද්‍රව්‍යාධාර සැපයීම සහ ඌව පළාතේ පාසල් දරුවන්ගේ සෞඛ්‍ය සම්පන්න බව තහවුරු කිරීම සඳහා පහසුකම් සැලසීමට හා ක්‍රීඩා කුසලතා ඔප්නංවා ගැනීමට ඉවහල් වන ලෙස ක්‍රීඩා දක්ෂතා දක්වන දරුවන් ඇගයීම, පහසුකම් සම්පාදනය කිරීම සහ භෞතික යටිතල පහසුකම් සම්පාදනය කිරීම සහ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද 1992 අංක 01 දරන ඌව නවෝදය අරමුදල ප්‍රඥප්තිය පරිච්ඡින්න කිරීම පිණිස ද වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, ඌව පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.


1A PG 3848 — 17 (2017/12)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය

1. මෙම ප්‍රඥප්තිය ඌව පළාතේ පළාත් සභාවේ 2017 අංක 5 දරන ඌව නවෝදය අරමුදල් ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, ඌව පළාතේ ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

ඌව නවෝදය අරමුදල පිහිටුවීම

2. (1) (මෙහි මින් මතු ''අරමුදල'' යනුවෙන් සඳහන් කරනු ලබන) ඌව නවෝදය අරමුදල යනුවෙන් සඳහන් කරනු ලබන අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) අරමුදල (1) වන වගන්තියේ ඊට දී ඇති නාමයෙන් සංස්ථාවක් වන අතර, ඊට අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් තිබිය යුතු ය. තව ද ඒ නාමයෙන් අරමුදල විසින් නඩු පැවරීම ද, අරමුදලට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කළ හැකි ය.

අරමුදලේ පාලක මණ්ඩලය

3. (1) අරමුදලේ පරිපාලනය, කළමනාකරණය සහ පාලනය මෙහි මින්මතු විධිවිධාන සලසා ඇති පරිදි සංස්ථාපනය කරන ලද පාලක මණ්ඩලයක් වෙත පැවරිය යුතු ය.

(2) (මෙහි මින්මතු ''මණ්ඩලය'' යනුවෙන් සඳහන් කරනු ලබන) අරමුදලේ පාලක මණ්ඩලය පහත දැක්වෙන සාමාජිකයින්ගෙන් සමන්විත විය යුතු ය.

(අ) ප්‍රධාන අමාත්‍යවරයා;

(ආ) අමාත්‍ය මණ්ඩලයේ අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයා;

(ඇ) ප්‍රධාන ලේකම්;

(ඈ) අධ්‍යාපන විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්;

(ඉ) මෙම ප්‍රඥප්තියේ විෂයභාර ආයතනයේ ලේකම්වරයා;

(ඊ) ප්‍රධාන අමාත්‍යවරයා විසින් දෙමළ හා මුස්ලිම් ජාතීන් නියෝජනය කරමින් පත් කරනු ලබන නියෝජිතයින් දෙදෙනෙක්;

(උ) විරුද්ධ පක්ෂයේ නායකවරයා හෝ ඔහු විසින් පත් කරනු ලබන නියෝජිතයෙක්;

(ඌ) විරුද්ධ පක්ෂයේ නායකවරයා විසින් පත් කරනු ලබන විරුද්ධ පක්ෂයේ පළාත් සභා නියෝජිතවරයන් දෙදෙනෙක්;

(3) ප්‍රධාන අමාත්‍යවරයා මණ්ඩලයේ සභාපතිවරයා විය යුතු ය.

(4) මෙම ප්‍රඥප්තියේ විෂයභාර ආයතනයේ ලේකම්වරයා නිල බලයෙන්ම මණ්ඩලයේ ලේකම්වරයා විය යුතු ය. ලේකම්වරයා මණ්ඩලයේ ප්‍රධාන ගණක නිළධාරියා ද විය යුතු ය.

(5) මණ්ඩලයේ පත් කළ සාමාජිකයින් විසින් සභාපති අමතා යවනු ලබන ලිපියක් මගින් ඕනෑම අවස්ථාවක ස්වකීය ධූරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(6) යම් තැනැත්තෙකු :-

(අ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බල පවත්වන නීතියක් යටතේ වස්තු භංගත්වයට පත් වූ හෝ බුන්වත් තැනැත්තෙකු බවට ප්‍රකාශ කරනු ලැබ නිදහස් නොකළ වස්තුභංගත්වයට පත් වූ හෝ බුන්වත් තැනැත්තකු නම්;

(ආ) සදාචාර විරෝධී අපචාරයකට සම්බන්ධව මාස හයකට නොඅඩු කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමෙන් දඬුවම් දිය හැකි වරදක් සිදු කර ඇත්නම්;

(ඇ) ශ්‍රී ලංකාවේ බලපවත්වන යම් නීතියක් යටතේ සිහිවිකල තැනැත්තෙකු හෝ ඌන මානසිකත්වයක් ඇති අයකු වේ නම්;

ඒ තැනැත්තා මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබීමට හෝ සාමාජිකයෙකු වශයෙන් දිගටම කටයුතු කරගෙන යාමට නුසුදුස්සකු විය යුතු ය.

(7) (5) වන සහ (6) වන ඡේදවල විධිවිධාන වලට යටත්ව මණ්ඩලයේ පත්කළ සාමාජිකයෙකුගේ ධූර කාලය වසර තුනක් විය යුතු ය.

(8) සභාපතිවරයා විසින් පත් කරන ලද නියෝජිතවරුන් කවර හෝ වේලාවක හේතු දක්වා සාමාජික ධූරයෙන් ඉවත් කරනු ලැබීමට සභාපතිවරයාට බලය ඇත. එකී පුරප්පාඩුව සඳහා නව නියෝජිතයින් පත් කිරීමට ප්‍රධාන අමාත්‍යවරයාට හැකි ය.

(9) මණ්ඩලයේ පත් කළ සාමාජිකයෙකු මියයාමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ ස්වකීය ධූර කාලය ඉකුත්වීමට පෙරාතුව අන්‍යාකාරයකින් තම ධූරය හිස් කරනු ලබන අවස්ථාවකදී ඒ සාමාජිකයා වෙනුවට පත් කරනු ලබන අනුප්‍රාප්තික සාමාජිකයා විසින් තමා අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ (පූර්වගාමියාගේ) ධූර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය සඳහා ධූරය දැරිය යුතු ය.

(10) මණ්ඩලයේ සාමාජිකයන් අතර, අදහස් පිළිබඳව වෙනස්කම් පවතින අවස්ථාවකදී බහුතරයේ තීරණය අනුගම්‍ය බල සහිත විය යුතු ය.

(11) මණ්ඩලයේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් පැවතීමේ හේතුව නිසාම පමණක් මණ්ඩලයේ කිසිම ක්‍රියාවක් හෝ කටයුත්තක් බල රහිත ලෙස සලකනු නොලැබිය යුතු ය.

(12) මණ්ඩලයේ යම් රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් තිදෙනෙකු විය යුතු ය.

(13) (09) වන වගන්තියේ විධිවිධාන වලට යටත්ව මණ්ඩලය විසින් එහි රැස්වීම් සහ ඒ රැස්වීම්වල කටයුතු කරගෙන යාම සම්බන්ධයෙන් එහි කාර්ය පටිපාටිය විධිමත් කරනු ලැබිය හැකි ය.

(14) මණ්ඩලයේ රැස්වීම් සභාපතිවරයාගේ නියෝගවලට අනුව හෝ මාස දෙකකට වරක් හෝ පැවැත්විය යුතු ය.

4. අරමුදලේ අරමුණු පහත දැක්වෙන පරිදි විය යුත්තේ ය:- අරමුදලේ අරමුණු

(අ) ඌව පළාත තුළ විශ්ව විද්‍යාල ප්‍රවේශයට සුදුසුකම් ලැබූ සහ උසස් පෙළ හැදෑරීමට සුදුසුකම් ලැබූ දක්ෂතා දැක්වූ දරුවන්ගේ අධ්‍යාපන අවශ්‍යතා සඳහා මූල්‍යාධාර සැපයීම සහ ද්‍රව්‍යාධාර සැපයීම;

(ආ) අධ්‍යාපනික වශයෙන් විශේෂ දක්ෂතා දක්වන ඌව පළාතේ සිසුන් ඇගයීම සඳහා යම් ප්‍රදානයන් කිරීම;

(ඇ) ඌව පළාතේ පාසල් දරුවන්ගේ සෞඛ්‍ය සම්පන්න බව තහවුරු කිරීම සඳහා පිරිසිදු පානීය ජලය ලබාදීමට මෙන්ම විශේෂිත රෝගයන්ට ගොදුරු වීමෙන් එම දරුවන් වළක්වා ගැනීම සඳහා යටිතල පහසුකම් සම්පාදනය කිරීම;

(ඈ) දිස්ත්‍රික්/පළාත්/ජාතික වශයෙන් පිළිගත් මට්ටමින් ක්‍රීඩා දක්ෂතා දක්වන ඌව පළාතේ සිසුන්ගේ ක්‍රීඩා නිපුණත්වය වැඩිදියුණු කිරීම සඳහා මූල්‍යාධාර ලබාදීම හා ශිෂ්‍යත්ව පිරිනැමීම;

(ඉ) පොදුවේ පාසල් දරුවන්ගේ සහ ක්‍රීඩා සංගම්වල සාමාජිකයන්ගේ ක්‍රීඩා කුසලතා වැඩිදියුණු කර ගැනීමට පිටුබලයක් වන පරිදි පවතින ක්‍රීඩාපිටිවල යටිතල පහසුකම් හා භෞතික තත්ත්වය වැඩිදියුණු කර සංවර්ධනය කිරීම මෙන්ම එවැනි පහසුකම් නොමැති ස්ථාන සඳහා නව ක්‍රීඩාපිටි හා පහසුකම් ස්ථාපිත කිරීම.

5. අරමුදලේ මුද්‍රාව - අරමුදලේ මුද්‍රාව

(අ) මණ්ඩලය විසින් කලින් කල නිශ්චය කරනු ලබන යම් තැනැත්තකුගේ භාරයේ තිබිය යුතු ය;

(ආ) මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන යම් ආකාරයකින් වෙනස් කරනු ලැබිය හැකි ය;

(ඇ) මණ්ඩලයේ බලය ඇතිව ද මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනෙකු ඉදිරිපිටදී ද හැර කවර වූ හෝ ලේඛනයකට අත්සන් තබනු නොලැබිය යුතු අතර, ඔවුන් දෙදෙනා තමන් පැමිණ සිටි බවට සාක්ෂි වශයෙන් ඒ ලේඛනය අත්සන් කළ යුතු ය.

6. (1) අරමුදලේ අරමුණු ක්‍රියාවට නැංවීම පිණිස අවශ්‍ය වන්නා වූ හෝ ආනුෂංගික වන්නා වූ සියලු දේ අරමුදලේ නමින් සිදු කිරීමට මණ්ඩලයට බලය ඇත්තේ ය. අරමුදලේ බලතල හා කර්තව්‍ය

(2) (1) වන උපවගන්තියෙන් පවරා දෙන ලද බලතලවලට හානියක් නොවන පරිදි මණ්ඩලයට පහත සඳහන් බලතල සහ කර්තව්‍යයන් තිබිය යුතුය.

(අ) අරමුදල් රැස්කිරීම සහ දේශීය හෝ විදේශීය මූලාශ්‍රවලින් ප්‍රදානයන්, ත්‍යාග හෝ පරිත්‍යාග ලබාගැනීම;

(ආ) මේ ප්‍රඥප්තිය යටතේ හෝ යම් මිලට ගැනීමක් ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නියාදනයක් මගින් හෝ අන්‍යාකාරයකින් මණ්ඩලය වෙත පැවරෙන යම් චංචල හෝ නිශ්චල දේපල අත්පත් කර ගැනීමට හා දැරීමට ද අරමුදලට බලය ඇති අතර, ඒවා විකිණීම, උකස් කිරීම, බදු දීම, ප්‍රදානය, පැවරීම, රික්තවරණය කිරීම, හුවමාරු කිරීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම;

(ඇ) අරමුදලේ පරමාර්ථ වැඩිදියුණු කිරීම සඳහා ලොතරැයි ක්‍රම පවත්වාගෙන යාම සහ තත්කාලයේ බලපවත්නා යම් නීතියකට යටත්ව මුදල් එකරැස් කිරීම;

(ඈ) අරමුදලේ පරමාර්ථ කරගෙන යාම සඳහා එහි බලතල, කාර්යය සහ කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීම, ඉටුකිරීම සහ සිදුකිරීම සඳහා අවශ්‍ය විය හැකි යම් සියලු ගිවිසුම්වලට සහ එකඟතාවයන්ට කෙලින්ම හෝ මණ්ඩලය විසින් තත්කාර්ය සඳහා ලිඛිතව බලය දෙන ලද නිලධරයන් සහ සේවකයන් නැතහොත් අනුනියෝජිතයින් මාර්ගයෙන් ඇතුළත් වී ක්‍රියාත්මක වීම;

(ඉ) අරමුදලට අයිති හෝ අරමුදල විසින් භුක්තිය දරනු ලබන යම් ඉඩමක කිසියම් ගොඩනැගිල්ලක් හෝ සැකිල්ලක් ඉදි කිරීම හෝ එසේ කිරීමට සැලැස්වීම;

(උ) 1992 අංක 01 දරන ඌව නවෝදය අරමුදලේ මුදල් ඇතුළුව අරමුදලට අයිති මුදල්, මණ්ඩලයේ ද කැමැත්ත ඇතිව, මුදල් ආයෝජනය කිරීම සඳහා නීතියෙන් බලය දෙන ලද කිසියම් ආයෝජනයකට යෙදවීම සහ නැවත ආයෝජනය කිරීම සහ ඒ ආයෝජකයන් වෙනස් කිරීම මණ්ඩලයේ කැමැත්ත පරිදි අවලංගු කිරීම සහ ඒ ආයෝජකයන්ගෙන් උපචිත වූ ආදයම් එකතු කිරීම; සහ

(ඌ) මණ්ඩලය විසින් නිවේදනය කරනු ලබන බැංකු හෝ බැංකුවල අරමුදල වෙනුවෙන් බැංකු ගිණුම් ආරම්භ කර ක්‍රියාත්මක කිරීම හා වසා දැමීම.

අරමුදලේ සංයුතිය

7. පහත දැක්වෙන මූලාශ්‍රවලින් ලැබෙන මුදල් අරමුදලට බැර කරනු ලැබිය යුතු ය :-

(අ) අරමුදල වෙනුවෙන් ඌව පළාත් සභාවෙන් ලබා දෙනු ලබන ආධාර;
(ආ) යම්කිසි පුද්ගලයකුගෙන් හෝ සංවිධානයක් මගින් කරනු ලබන මූල්‍ය හෝ වෙනත් ආකාරයක ආධාර හෝ පරිත්‍යාග;
(ඇ) මණ්ඩල මගින් සංවිධානය කරනු ලබන යම්කිසි ලොතරැයියක් මගින් හෝ සැණකෙලියක් මගින් ලබා ගත හැකි වන්නා වූ ආදයම්;
(ඈ) මුදල් ආයෝජනය කිරීමෙන් ලැබෙන්නා වූ යම්කිසි පොලියක් හෝ ලාභාංශ;
(ඉ) විදේශීය මූලාශ්‍රවලින් කරනු ලබන ආධාර, පරිත්‍යාග හෝ ප්‍රදානයන්;
(ඊ) වෙනත් යම් ආකාරයකින් අරමුදල වෙත ලැබෙන්නා වූ කිසියම් ලැබීම්;
(උ) 1992 අංක 01 දරන ඌව නවෝදය අරමුදලේ මුදල් ඒකාබද්ධ කිරීමෙන්.

අරමුදලෙන් කරනු ලබන ගෙවීම්

8. පහත දැක්වෙන වියදම් අරමුදලින් දැරිය හැකි වන්නේ ය :-

(අ) අරමුදලේ පරමාර්ථ ඉටු කරගෙන යාමේ කාර්යය සඳහා අවශ්‍ය වන්නා වූ අරමුදල මගින් අනුමත කරන සියලු ගෙවීම්;

(ආ) අරමුදල පිහිටුවා පවත්වා ගෙන යාම සහ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වියදම්;

9. (අ) මණ්ඩලයේ ඉල්ලීමට අනුකූලව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව යටතේ සිටින කිසියම් නිලධරයකු හා/හෝ සේවකයකු ප්‍රධාන ලේකම්වරයාගේ හා එම නිලධාරියාගේ කැමැත්ත පරිදි අරමුදලේ කාර්යය සඳහා මණ්ඩලය තීරණය කරනු ලබන කාල සීමාවන් වෙනුවෙන් සේවයේ යොදවා ගත හැකි ය.

(ආ) එසේ පත් කරනු ලබන නිලධරයා හා/හෝ සේවකයා මණ්ඩලයේ සේවය කරනු ලබන කාලසීමාව පළාත් සභාවට කරනු ලබන සේවාවක් සේ සලකනු ලැබිය යුතු ය.

ගිණුම් හා විගණනය

10. (1) මණ්ඩලය විසින් එහි ආදයම සහ වියදම, වත්කම් හා බැරකම් සහ අරමුදලේ වෙනත් සියලු ගනුදෙනු ගිණුම්කරණ ප්‍රමිතීන් අනුව යාවත්කාලීන කර පවත්වාගෙන යා යුතු ය.

(2) මණ්ඩලය විසින් එක් එක් වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දින වන විට එහි ගිනුම්පොත්වල ශේෂය ගණනය කරනු ලැබීමට සැලැස්විය යුතු අතර, ඊළඟ වර්ෂයේ මාර්තු මස තිස්එක් වන දිනට පෙරාතුව අදාළ වර්ෂය සඳහා ආදායම් සහ වියදම් ගිණුම සහ පළමුව සඳහන් කරන ලද දිනයට සකස් කළ යුතු අරමුදලේ වත්කම් සහ බැරකම් පිළිබඳ සංක්ෂේපයන් ඇතුළත් ශේෂපත්‍ර ඇතුළත් අවසන් ගිණුමක් සකස් කිරීමට සලස්වනු ලැබිය යුතු ය.

(3) (2) වන ඡේදයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා 9(අ) වගන්තිය ප්‍රකාරව ඌව පළාත් සභාවේ සේවයේ නියුතු ගණකාධිකාරිවරයකුගේ සහාය ලබාගත හැකි වන්නේ ය.

(4) යෝජනා සම්මතයක් මගින් මණ්ඩලය විසින් තත්කාර්ය සඳහා බලය දෙන ලද මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනෙකු විසින් මණ්ඩලයේ ආදායම් හා වියදම් ගිණුම් සහ ශේෂ පත්‍රය සහතික කරනු ලැබිය යුතු ය.

(5) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවට අනුකූලව සෑම අවුරුද්දකම අරමුදලේ ගිණුම් විගණකාධිපතිවරයා විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

11. අරමුදලේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය. අරමුදලේ මුදල් වර්ෂය

12. යම් අධිකරණයක් ඉදිරිපිටදී අරමුදල විසින් හෝ අරමුදලට එරෙහිව පවරන ලද යම් නීති කෘත්‍යයක් සම්බන්ධයෙන් අරමුදල විසින් දැරිය යුතු යම් වියදමක් වේ නම් එම මුදල අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය. වියදම් ප්‍රතිපූර්ණය කිරීම

13 (1) නියම කළ යුතු යැයි මේ ප්‍රඥප්ති මගින් නියමිත හෝ නියෝග සෑදීමට මේ ප්‍රඥප්තිය මගින් බලය දී ඇති හෝ අවශ්‍ය විය හැකි සියලු කාරණා සඳහා හෝ ඒ සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් රීති හෝ නියෝග සෑදිය හැකි ය. අමාත්‍යවරයා විසින් නියෝග සෑදිය හැකි බව

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම රීතියක් ම හෝ නියෝගයක් ම *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබීමේ දින සිට හෝ ඒ නියෝගයේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් පසු දිනක සිට හෝ ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම රීතියක් ම හෝ නියෝගයක් ම *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබීමෙන් පසු හැකි ඉක්මනින් අනුමැතිය සඳහා පළාත් සභා වෙත ඉදිරිපත් කළ යුතු ය. පළාත් සභාව විසින් අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් එකී අනුමත දිනයේ සිට එකී රීතිය හෝ නියෝග යටතේ කලින් කරන ලද ක්‍රියාවකට ඉන් හානියක් නොවන පරිදි පරිච්චින්න කරනු ලැබූ ලෙස සැලකිය යුතුය.

(4) යම් රීතියක් හෝ නියෝගයක් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකන දිනය පිළිබඳ නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු ය.

(5) ඉහත (1) උප වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලබන රීති හෝ නියෝග පළාත් සභාවේ සම්මත වීමෙන් පසුව ඒවා මෙම ප්‍රඥප්තිය මගින් පැනවුවාක් මෙන් බලාත්මක විය යුතු ය.

14. අරමුදලේ සියලු නිලධරයන් සහ සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්යය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය. අරමුදලේ නිලධරයන් සහ සේවකයන් දණ්ඩ නීති සංග්‍රහය යටතේ රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු බව

15. අරමුදල අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් වශයෙන් සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව අදාළ කරගනු ලැබිය යුතු ය. අරමුදල අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සැලකිය යුතු බව

16. මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දින සිට 1992 අංක 1 දරන ඌව නවෝදය අරමුදල ප්‍රඥප්තිය පරිච්ඡින්න වන අතර, මෙතෙක් 1992 අංක 01 දරන ප්‍රඥප්තිය මගින් සිදු කරන ලද සියලු ක්‍රියාකාරකම් සඳහා අගතියක් නොවන අතර, එය මෙම ප්‍රඥප්තිය මඟින් ඉටු කරන ලද්දක් සේ සැලකිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

17. මෙම ප්‍රඥප්තියේ සිංහල සහ දෙමළ පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

අර්ථ නිරූපණය

18. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ ප්‍රඥප්තියෙහි -

''ප්‍රධාන අමාත්‍යවරයා'' යන්නෙන් ඌව පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයා ද;

''අමාත්‍ය මණ්ඩලයේ අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයා'' යන්නෙන් ඌව පළාත් සභාවේ අමාත්‍ය මණ්ඩලයේ අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයා ද;

''ප්‍රධාන ලේකම්'' යන්නෙන් ඌව පළාතේ ප්‍රධාන ලේකම් ද;

''අධ්‍යාපන විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්'' යන්නෙන් ඌව පළාතේ අධ්‍යාපන විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් ද;

''මෙම ප්‍රඥප්තියේ විෂයභාර ආයතනයේ ලේකම්වරයා'' යන්නෙන් මෙම ප්‍රඥප්තියේ පාලක මණ්ඩලයේ තීරණ ප්‍රකාරව අරමුදලේ කටයුතු ක්‍රියාත්මක කරනු ලබන ආයතනයේ ලේකම්වරයා ද;

වන්නේ ය.

01- 390

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.